// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1960/35 - 2016 මාර්තු මස 30 වැනි බදාදා - 2016.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## අතුරු ව්‍යවස්ථා

### උතුරු මැද පළාතේ පළාත් සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් උතුරු මැද පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන සුදසිංහ මුදියන්සේලාගේ පේශල ජයරත්න බණ්ඩාර වන මවිසින් සාදන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට පළාත් පාලන ආයතනවලට බලය ලැබී ඇති අතර, මෙම කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමට උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතනවලට මෙයින් බලය පවරනු ලැබේ.

සුදසිංහ මුදියන්සේලාගේ පේශල ජයරත්න බණ්ඩාර,
ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන අමාත්‍ය,
උතුරු මැද පළාත.

2016 මාර්තු මස 23 වන දින.
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
උතුරු මැද පළාත් සභාව,
අනුරාධපුර.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**........................ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මෙම අතුරු ව්‍යවස්ථා ...... ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ බත්කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වාගෙන යාම අරමුණු කොටගෙන මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126(ix)(ඌ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටුකළ යුතු කාර්යයන්

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ බත් කඩයකට, ආපනශාලාවකට, තේ හෝ කෝපි කඩයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

(2) ස්ථානයේ සෑම කාමරයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(*ආ*) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා අති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම

(*අ*) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(*ආ*) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(12) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගනුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) ගනුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් හෝ මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරුකර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරුකර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේපකර තිබිය යුතු ය.

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (16) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය.

(18) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගනුදෙනුකරුවන්ගේ අත් සේදීමට මල නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(20) ප්‍රාදේශීය සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අප ජලය ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලා පවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවක එකී අපජලය උරා ගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය.

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු ය.

5. තීන්ත ආලේපකර තිබිය යුතු යයි සහ 4(2) වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

6. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදුකර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති ආකාරයෙන් වර්ගකර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන්වල දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

10. *(අ)* බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරායකර අපද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස ප්‍රාදේශීය සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

11. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර, එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණයවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. ගනුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

13. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාල කළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාල කළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

14. බලපත්‍ර ලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. බලපත්‍ර ලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

16. .................................... ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන උපලේඛන අංක 01 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍ර ලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය.

අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

17. සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ................. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ බත් කඩයක්, ආපනශාලාවක්, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම නොකල යුතු ය. නොකළ යුතු කාර්යයන්

18. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසල කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

19. *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන හා බීජ පෝෂණ කාලසීමාව ඉකුත්වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍ර ලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ඇ)* බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු යි.

20. කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ බුලත් සැපීම නොකළ යුතු ය.

අය කිරීම් හා ගාස්තු

21. කිසියම් බත් කඩ, ආපනශාලා තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය.

බලය පැවරීම

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු නියාමනය අධීක්ෂණය හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති එහි සභාපති හෝ ලේකම් විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරී ම නිත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

23. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය

24. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

25. නියමයක් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට පරීක්ෂා කිරීම සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධාකිරීමක් නොකළ යුතු ය.

26. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බත් කඩයක්, ආපන ශාලාවක්, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

27. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

28. අතුරු ව්‍යවස්ථාවේ 26 හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය.

29. අතුරු ව්‍යවස්ථාවේ 26 හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියමකර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියමකර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

30. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචික ප්‍රාදේශීය සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය.

31. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට, සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

32. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

දඩ හා දණ්ඩන

33. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයන් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට

යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකටද යටත් විය යුතුය.

34. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

අර්ථ නිරූපනය හා නිර්වචන

"සභාපතිවරයා " ................................... ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ලේකම්වරයා " ................................... තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, .................................... ප්‍රාදේශීය සභාව ද අදහස් වන්නේය.

"ආපන ශාලාව හෝ බත් කඩය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් අදහස් වන අතර, ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

"තේ හෝ කෝපි කඩය" යන්නෙන්, බේකරි නිෂ්පාදන හෝ වෙනත් කෙටි ආහාර සමග තේ හෝ කෝපි විකිණීම සඳහා පවත්වාගෙන යනු ලබන ස්ථානයක්.

"බලපත්‍රලාභියා " යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමටද එකී ස්ථානය ද

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් 'ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති,.......................... ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස්වේ.

උපලේඛනය

*උපලේඛනය 1*

............................. *ප්‍රාදේශීය සභාව*

**වෙළඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20........... වර්ෂය**

1. කර්මාන්තය/වෙළඳාම හිමිකරුගේ නම : ...........................................

2. පෞද්ගලික ලිපිනය : ............................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

4. දුරකථන අංකය : ජංගම : ........................................... නිවාස : ...........................................

5. කර්මාන්තයේ/වෙළඳ ව්‍යාපාරයේ නම : ...........................................

6. කර්මාන්තයේ /වෙළඳාමේ ස්වභාවය : ...........................................

කර්මාන්තය/වෙළඳාම කරන ස්ථානයේ : ............................................

(අ) ලිපිනය : ............................................

(ආ) වීථියේ/පාරේ නම : ............................................

(ඇ) වරිපනම් අංකය : ............................................

(ඈ) දුරකථන අංකය : ............................................

7. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය : ............................................

කොට්ඨාසයේ නම : ............................................

8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය : ............................................

9. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළමණාකරුගේ/නියෝජිතයාගේ නම : ............................................

10. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

11. දුරකථන අංක : ජංගම : ............................................

නිවස : ............................................

සභාපති

.....................................

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20........... වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය : .................

.....................................

ඉල්ලුම්කරුගේ අත්සන.

**....................................... ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. මෙම අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වාගෙන යාම අරමුණු කොටගෙන මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට ඇත. — අරමුණ

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126(ix)(ඌ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. උපලේඛන 1 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය. — ඉටු කළ යුතු කාර්යයන්

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූරණ කර ඇත්තේ නම් මිස සභාපති විසින් කවර හෝ හෝටලයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අළුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(2) ස්ථානයේ සෑම කාමරයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ගඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයක ම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 14 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(12.) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) ගණුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (16) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය.

(18) ස්ථානයේ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගණුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(20) ප්‍රාදේශීය සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අප ජලය ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර, එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වළකට ගලා යාමට සලස්වා තිබි යුතු ය.

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය.

(23) ස්ථානයේ ගණුදෙනුකරුවන්ට හා සේවකයන්ට නිදාගැනීමට වෙන්කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් මීටර් හතරකට නොඅඩු විය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යයි සහ 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර, අප ජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයෙහි රාත්‍රිය නතර වී සිටීමට පැමිණෙන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය හා අනන්‍යතාව සටහන් කරන ලේඛනයක් සෑම බලපත්‍රලත් ස්ථානයකම පවත්වා ගත යුතු අතර, සභාපතිවරයා, බලයලත් නිලධාරියා හේ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩ දීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාමරයක ම එක් ගණුදෙනුකරුවකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අනෙක් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට සැලැස්වීම නොකළ යුතුවාත් හැර පසුව පැමිණෙන ගණුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩ දීමට පෙර එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය හතරක් වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැළැස්විය යුතු ය.

10. සෑම බලපත්‍රලත් ස්ථානයකම සෑම කාමරයක්, හිණිපෙලක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනක ම මධ්‍යහනයට පෙර අතු ගෑමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

11. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය. එසේ වුව ද ගණුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක වැසිකිළි දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකි ය.

12. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර, පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 14 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන් වල දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

14. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;
(ii) වීදුරු ;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(iv) පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;

(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර , ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

15. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගතයුතු අතර , එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර, එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

17. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්තවන සෑම අවස්ථාවකම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

නොකළ යුතු කාර්යයන්

19. සභාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටලයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තකුට නිදගැනීමට ඉඩදීම නොකළ යුතුය.

21. 5 වන අතුරු ව්‍යවස්ථාවේ (23) වන ඡේදයේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිද ගැනීමට බලපත්‍රලාභියා විසින් ඉඩදීම නොකළ යුතු ය.

22. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්ත්වයකු තබා ගැනීම නොකළ යුතු ය.

23. බලපත්‍රලත් ස්ථානයේ ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනිත් තැන දැමීම නොකළ යුතු ය.

24. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාල කළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාල කළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85 කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

25. *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තකුගේ සහායකයකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය;

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

26. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබාගැනීම නිත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

පළාත් පාලන ආයතනයේ කාර්යභාරය

27. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස්වේ.

28. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය, ඒ නියමයට අනුකූල තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

29. කිසියම් හෝටලයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශී සභා පනතේ 149 වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේ ය.

බලය පැවරීම

30. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියමනය කිරීම සම්බන්ධයෙන් එහි සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

31. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

32. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස්වේ.

33. අතුරු ව්‍යවස්ථාවේ 28 හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතු ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

34. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේ ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

35. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

දඩ හා දණ්ඩන

36. 28 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

37. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකටද යටත් විය යුතුය.

අර්ථ නිරූපනය හා නිර්වචන

38. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල —

"සභාපතිවරයා " යන්නෙන් ............................. ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ලේකම්වරයා " යන්නෙන් ................................ තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, ප්‍රාදේශීය සභාවද අදහස් වේ.

“හෝටලය” යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් හෝ එකී කාර්යයන් සමග ගණුදෙනුකරුවන්ට නවාතැන් ගැනීමට ඉඩකඩ සලස්වා ඇති ස්ථානයක් අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද ;

"බලයලත් ස්ථානය" යන්නෙන්, මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද එකී ස්ථානය ද

"බලයලත් නිලධාරියා " යන්නෙන්, තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් “ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ” ...................... ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස්වේ.

උපලේඛනය

*උපලේඛනය 1*

............................. *ප්‍රාදේශීය සභාව*

**වෙළඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20........... වර්ෂය**

1. කර්මාන්තය/වෙළඳාම හිමි කරුගේ නම : ...........................................

2. පෞද්ගලික ලිපිනය : ...........................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

4. දුරකථන අංකය : ජංගම : ...........................................   නිවාස : ...........................................

5. කර්මාන්තයේ/වෙළඳ ව්‍යාපාරයේ නම : ...........................................

6. කර්මාන්තයේ /වෙළඳාමේ ස්වභාවය : ...........................................

කර්මාන්තය/වෙළඳාම කරන ස්ථානයේ : ...........................................

*(අ)* ලිපිනය : ...........................................

*(ආ)* වීථියේ/පාරේ නම : ...........................................

*(ඇ)* වරිපනම් අංකය : ...........................................

*(ඈ)* දුරකථන අංකය : ...........................................

7. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය : ........................................... කොට්ඨාසයේ නම : ...........................................

8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය : ...........................................

9. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළමණාකරුගේ/නියෝජිතයාගේ නම : ...........................................

10. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

11. දුරකථන අංක : ජංගම : ...........................................
නිවස : ...........................................
සභාපති
.....................................

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20............ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය : 20................

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

## .................. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහ ජනතාවගේ ප්‍රජාසංවර්ධනය සඳහා ක්‍රීඩා භූමි පහසුකම් සැපයීම අරමුණ කරගෙන මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමඟ කියවිය යුතු 126 (xiv)උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටු කළ යුතු කාර්යයන්

4. ප්‍රාදේශීය සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඉදිරිපත් කළ යුතුය.

5. පරිහරණය කිරීම සඳහා ක්‍රීඩා භූමියක් වෙන්කර ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම, එකී වෙන්කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සිදුකළ යුතු ය. කවර හෝ තැනැත්තෙකු විසින් කෙරෙන ඉල්ලීම, ක්‍රීඩා භූමිය වෙන්කර ගැනීමට අවශ්‍ය වන දිනට දින තුනකට පෙර ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ හැකි අතර එකී ඉල්ලීමට අනුව කරනු ලබන වෙන් කිරීම 7 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් විය යුතුය.

නොකළ යුතු කාර්යයන්

6. (අ) කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියකට හානි පැමිණවීම හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකළ යුතු අතර ක්‍රීඩා භූමිය තුළට ගවයන්, ඌරන්, අශ්වයන්, පෝනියන්, කොටළුවන් හෝ බල්ලන් ඇතුල්කිරීම නොකළ යුතු ය. එසේම තව දුරටත්, සභාපතිවරයාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව කිසිදු වාහනයක් කවර හෝ ක්‍රීඩා භූමියකට ඇතුල්කිරීම නොකළ යුතුය.

(ආ) බීමත්ව හැසිරීම අශෝභන ලෙස හැසිරීම මත්ද්‍රව්‍ය පාවිච්චි කර හැසිරීම බාහිර පාර්ශ්වයන්ට අනවශ්‍ය ලෙස හිරිහැර කිරීම නොකළ යුතුයි.

පළාත් පාලන ආයතනයේ කාර්යභාරය

7. 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු වෙත ප්‍රාදේශීය සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී මෙහි පහත දැක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

*(අ)* ක්‍රීඩා භූමි ප්‍රයෝජනයට ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් ම ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සලකා බැලිය යුතු ය. එසේ වුව ද ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ලැබෙන අයදුම්පත්‍ර අතරින් කිසියම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩාවකට සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් වන අයදුම් පත්‍රයකට ප්‍රමුඛතාව දිය යුතු ය.

*(ආ)* මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආදර්ශ ගාස්තු චක්‍රයට අනුව ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට ක්‍රීඩා භූමි වෙන් කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ වෙන්කර ගන්නා ලද කිසියම් ක්‍රීඩා භූමියක, එකී වෙන්කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවෙකුට අවශ්‍ය වන අවස්ථාවක පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉඩ දීමට සභාපතිවරයාට හැකි ය.

*(අ)* වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ක්‍රීඩා භූමිය වෙන් කර ගනු ලැබූ දිනට -

(i) මාස තුනකට පෙර වනවිට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහක්,
(ii) මාස දෙකකට පෙර වනවිට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට දහයක්,
(iii) මාසයකට පෙර වනවිට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහළොවක්,
(iv) දින පහළොවකට පෙර වනවිට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට විසි පහක්,
(v) දින හතකට පෙර වනවිට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පනහක්,
(vi) දින තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට හැත්තෑ පහක්,

ප්‍රාදේශීය සභා අරමුදලේ රඳවා ගැනීමට යටත්ව විය යුතු ය.

(ආ) වෙන් කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ක්‍රීඩා භූමිය වෙන්කර ගනු ලැබූ දිනට දින තුනකට වඩා අඩු කාලයක දී නම් ගෙවනු ලැබූ ගාස්තුව ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(ඇ) කිසියම් වෙන් කිරීමක් අවලංගු කරවා ගනු ලැබූ විටක දී එකී වෙන්කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පතු මුදල සම්පූර්ණයෙන් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම් තිබිය යුතු ය.

(ඈ) කිසියම් තැනැත්තෙකු විසින් වෙන්කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක් වෙන්කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

(ඉ) ක්‍රීඩා භූමියක් වෙන්කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක්, කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

9. කවර හෝ තැනැත්තෙකු විසින් ක්‍රීඩා භූමියේ වෙන්කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවක දී, එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ දිනයේ දීම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීම සභාපතිවරයා ගේ කාර්යය වන්නේ ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන විධිවිධාන අනුව ක්‍රීඩා භූමියක් කිසියම් කාර්යයක් සඳහා වෙන්කර නොමැති කවර හෝ අවස්ථාවක එකී ක්‍රීඩා භූමිය, ක්‍රීඩා කිරීම හෝ ක්‍රීඩා පුහුණුවීම් කටයුතු හෝ සඳහා යොදා ගැනීමට ඉඩදීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

11. කිසියම් ක්‍රීඩා පිටියක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය. අයකිරීම් හා ගාස්තු

12. කිසියම් කාර්යයක් සඳහා වෙන්කරනු ලැබූ ක්‍රීඩා භූමියක් අදළ කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන් -

(අ) ක්‍රීඩා භූමිය හෝ එහි යම් කොටසකට හෝ සිදුවී ඇති යම් අලාභයක් වේ නම් ඒ අලාභයේ වටිනාකම සහ

(ආ) ක්‍රීඩා භූමිය වෙන්කර ගනු ලැබූ කාලසීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකි ය .

13. (අ) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වෙන්කර ගනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් එසේ වෙන්කර ගනු ලැබූ දිනයේදී ප්‍රාදේශීය සභාවේ කිසියම් අත්‍යවශ්‍ය කාර්යයක් සඳහා අවශ්‍ය වන විටක, එකී වෙන්කිරීම අවලංගු කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුවද එවැනි අවලංගු කිරීමක් සිදු කරනු ලබන්නේ නම්

එකී අවලංගු කිරීම ක්‍රීඩා භූමිය වෙන්කරනු ලැබූ දිනට දින තුනකට පෙර ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුවාත් හැර ඔහු විසින් ගෙවන ලද ගාස්තුව සහ තැන්පත් මුදල සම්පූර්ණයෙන් ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතුය. තවදුරටත් එසේ ම, එවැනි අවලංගු කිරීමක්, වෙන්කර ගනු ලැබූ දිනට පෙර දින තුනකට වඩා අඩු කාලයකදී සිදු නොකළ යුතු ය.

(ආ) කිසියම් ක්‍රීඩා භූමියක් වෙන් කර ගනු ලැබූ තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් එකී වෙන් කර ගනු ලැබූ දිනයේ දී හදිසි හා විශේෂ අවශ්‍යතාවයක් මත කිසියම් වේලාවක් ඇතුළත ක්‍රීඩා පිටිය පාවිච්චි කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වුවහොත් එම කාලය ඇතුලත ක්‍රීඩා පිටිය නිදහස් කර දීමට වෙන් කර ගනු ලැබූ තැනැත්තා හෝ ආයතනය ක්‍රියා කළ යුතුය.

14. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් එහි සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේය. බලය පැවරීම

15. කිසියම් කාර්යයක් සඳහා වෙන්කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක්, එසේ වෙන්කර ගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

16. නියමයක් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට පරීක්ෂා කිරීම සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකල යුතුය. පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

17. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචික ප්‍රාදේශීය සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

18. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩකිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

දඩ හා දණ්ඩන

19. මෙම අතුරු ව්‍යවස්ථා කඩකිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපනය හා නිර්වචන

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"සභාපතිවරයා" යන්නෙන්, ......................... ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, ......................... ප්‍රාදේශීය සභාවද අදහස් වන්නේය.

"ලේකම්වරයා" යන්නෙන්, ......................... තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"බලපත්‍ර ලත් ස්ථානය" යන්නෙන්, ......................... මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමටද එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ........................... ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස් වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස්වේ.

"ක්‍රීඩා භූමිය" යන්නෙන් ක්‍රීඩා කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර දෙනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් අදහස් වන අතර ක්‍රීඩා භූමිය වටා ඉදිකර ඇති තාප්පය හෝ වැට හෝ ඒ තුළ ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඒ කිසියම් ඉදිකිරීමක කොටසක් හෝ කිසියම් සවිකිරීමක් හෝ උපකරණ ද ඊට ඇතුළත් විය යුතු ය.

"ක්‍රීඩාව" යන්නෙන්, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ ඊට දී ඇති අර්ථය ම අදහස් විය යුතු ය.

*පළමුවැනි උපලේඛනය*

*4 වැනි අතුරු ව්‍යවස්ථාව*

**................................................ . ක්‍රීඩා භූමිය පරිහරණය සඳහා අවසර ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ නම : ...................................................
ලිපිනය : ...................................................
ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : ...................................................

02. ක්‍රීඩා භූමිය ඉල්ලුම්කරන කාරණය : ...................................................

03. අවශ්‍ය කරන දිනය හා වේලාව : ...................................................

| දින සිට | දින තෙක් | වේලාව |
|---|---|---|
| .......................... | .......................... | .......................... |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීමට අනුව අදාළ ක්‍රීඩා භූමිය වෙන්කර දෙනු ලැබුවහොත් එම ක්‍රීඩා භූමියේ ගොඩනැගිලිවලට, ඉදිකිරීම්වලට, උපකරණවලට සහ සවිකිරීම්වලට කිසියම් හානියක් වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් ප්‍රාදේශීය සභාව විසින් අයකර ගනු ලැබීමට එකඟ වන අතර, එකී තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට තවදුරටත් අවශ්‍ය වන මුදල් ප්‍රාදේශීය සභාවට ගෙවීමට ද එකඟ වෙමි. එසේම ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

....................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .........................

දෙවැනි උපලේඛනය

*7 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය*

**ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ඉඩදීමට අයකරන ගාස්තු වක්‍රය**

| | ක්‍රීඩා භූමියේ නම | ගාස්තුව<br>රු. ශ. | තැන්පත් මුදල<br>රු. ශ. | අතිරේක පැයකට ගාස්තුව<br>රු. ශ. |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02. | | | | |
| 03. | | | | |
| 04. | | | | |

**................. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. මෙම අතුරු ව්‍යවස්ථා ...................... ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ නවාතැන් පොළ විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. ............................. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන නවාතැන් පොළවල් මහජන සෞඛ්‍ය ආරක්ෂා වන අයුරින් සහ පරිසර හිතකාමීව පවත්වාගෙන යාම මෙම අතුරු ව්‍යවස්ථාවේ අරමුණ වේ. අරමුණ

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126(ix)(ඉ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. අතුරු ව්‍යාස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. උපලේඛන 1 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍ර ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්ය සහ වගකීම වන්නේය. ඉටු කළ යුතු කාර්යයන්

5. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ නවාතැන්පොළකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

   (1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

   (2) ස්ථානයේ සෑම කාමරයකම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

   (3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

   (4) සෑම කාමරයකටම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය,

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය,

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2කට උසින් පිහිටා තිබිය යුතු අතර, අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය,

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර, මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.,

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 15 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය,

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

*(ආ)* යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(11) ස්ථානයේ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

*(ආ)* යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(12) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩාකර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුටම එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි හා කැසිකිළි ද ගණුදෙනුකරුවන්ගේ පොදු පරිහරණයට වෙන් කළ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි හා කැසිකිළි එකක් තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන්, කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර, මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය,

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර, (16) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය,

(18) ස්ථානයේ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගණුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය,

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය,

(20) ප්‍රාදේශීය සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අපජලය ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර, එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වළකට ගලායාමට සලස්වා තිබිය යුතු ය,

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර, ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය,

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය,

(23) ස්ථානයේ ගණුදෙනුකරුවන්ට හා සේවකයන්ට නිදාගැනීමට වෙන්කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් මීටර් හතරකට නොඅඩු විය යුතු අතර, සෑම නිදන කාමරයකම ඇඳුම් තැබීමට අල්මාරියක් හෝ කැබිනෙට්ටුවක්, තුවා රාක්කයක් නවාතැන්කරුගේ හෝ නවාතැන්කරුවන්ගේ භාණ්ඩ තැබීමට මේසයක් හා වැසිකිළියක් සහිත නාන කාමරයක් තිබිය යුතු ය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ඉල්ලා සිටින කවර හෝ තැනැත්තෙකු විසින් මේ කොටසේ උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

7. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 5(2) වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර, අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදුකර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයෙහි රාත්‍රිය නතර වී සිටීමට පැමිණෙන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය හා අනන්‍යතාව සටහන් කරන ලේඛනයක් සෑම බලපත්‍රලත් ස්ථානයක ම පවත්වා ගත යුතු අතර, සභාපතිවරයා, බලයලත් නිලධාරියා හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක දී එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාමරයකම එක් ගණුදෙනුකරුවෙකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගණුදෙණුකරුවෙකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අනෙක් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට සැලැස්වීම නොකළ යුතුවාක් හැර පසුව පැමිණෙන ගණුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩ දීමට පෙර එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය හතරක්වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැළැස්විය යුතුය.

11. සෑම බලපත්‍රලත් ස්ථානයකම සෑම කාමරයක්, හිණිපෙලක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනකම මධ්‍යාහ්නයට පෙර අතුගෑමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

12. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වාගත යුතු ය. එසේ වුව ද ගණුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක වැසිකිළි දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකිය.

13. බලපත්‍රලත් ස්ථානයේ ආහාරපාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක්ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

14. බලපත්‍ර ලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 15 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන් වලදී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

15.*(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

16. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

17. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

19. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

නොකළ යුතු කාර්යයන්

20. සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ නවාතැන් පොළක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තෙකුට නිදාගැනීමට ඉඩදීම නොකළ යුතු ය.

22. 5 වන අතුරු ව්‍යවස්ථාවේ (23) වන ඡේදයේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිදා ගැනීමට ඉඩ දීම නොකළ යුතු ය.

23. කිසියම් නවාතැන් පොළක තනි කාමරයක එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ යුගල කාමරයක දෙදෙනෙකුට වැඩියෙන් හෝ ත්‍රිත්ව කාමරයක තුන් දෙනෙකුට වැඩියෙන් හෝ නිදාගැනීමට ඉඩදීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය. එසේ වුව ද මේ කිසියම් කාමරයක නිදා ගන්නා යම් තැනැත්තෙකු වයස අවුරුදු 12 ට අඩු අයෙකු වන විට මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ඔහු එක් අයෙකු ලෙස සැලකීම නොකළ යුතු ය.

24. කිසියම් නවාතැන් පොළක රාත්‍රී නවාතැන් ගන්නා සෑම තැනැත්තෙකු ම තම අනන්‍යතාව බලපත්‍රලාභියා වෙත ඉදිරිපත් කළ යුතු අතර, නවාතැන් පොළෙහි පවත්වාගෙන යනු ලබන අමුත්තන්ගේ ලේඛනයෙහි තමාගේ තොරතුරු ඇතුළත් කරන තීරුවේ තම නම අත්සන් කළ යුතු ය. එසේ ම තම අනන්‍යතාව ඉදිරිපත් නොකරන හෝ අමුත්තන්ගේ ලේඛනයෙහි තම අනන්‍යතාව පිළිබඳ තොරතුරු ඇතුළත් තීරුවේ නම අත්සන් කිරීම නොකරන කවර හෝ තැනැත්තෙකුට බලපත්‍රලත් ස්ථානයේ කවර හෝ කොටසක රාත්‍රී කාලයේ නවාතැන් ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

25. කවර හෝ නවාතැන් පොළක සදාචාර විරෝධී කාර්යයන් සඳහා යොදා ගැනීමට ඉඩනොදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර කවර හෝ තැනැත්තෙකු විසින් නවාතැන් පොළෙහි වෙනත් නවාතැන්කරුවන්ගේ හෝ නවාතැන් පොළ ආසන්නයේ පදිංචිකරුවන්ට බාධාවක් වන ආකාරයෙන් ගීත ගායනා කිරීම හෝ තැටි වාදන යන්ත්‍ර ක්‍රියා කරවීම හෝ අනවශ්‍ය ආකාරයේ ශබ්ද ඇති කිරීම හෝ නොකළ යුතු ය.

26. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්ත්වයෙකු තබා ගැනීම නොකළ යුතු ය.

27. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

28. කිසියම් බලපත්‍රලත් ස්ථානයක ඇති නිදන කාමර ඇතුළත කවර හෝ අවස්ථාවක -

(අ) තනි කාමරයක එක් ඇඳකට වැඩියෙන් ද,
(ආ) යුගල කාමරයක ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකකට වැඩියෙන් ද,
(ඇ) ත්‍රිත්ව කාමරයක ද්විත්ව ඇඳක් හා තනි ඇඳකට හෝ තනි ඇඳන් තුනකට වැඩියෙන් ද,
(ඈ) පවුල් කාමරයක ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහකට වැඩියෙන් ද,

තැබීම නොකළ යුතු ය.

29. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙ හි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැන්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

30. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිළ දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

පළාත් පාලන ආයතනයේ කාර්යභාරය

31. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් නවාතැන්පොළක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 5 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

32. කිසියම් නවාතැන්පොළක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය.

බලය පැවරීම

33. මෙහි බලය පැවරීම මෙම අතුරු ව්‍යවස්ථාව නියාමනය කිරීම සම්බන්ධයෙන් එහි සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

34. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

35. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ ව්‍යාපාරික කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

36. 31 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

37. 31 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

38. නියමයක් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට පරීක්ෂා කිරීම සඳහා සහායවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධාකිරීමක් නොකළ යුතු ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

39. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව ප්‍රාදේශීය සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේ ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

40. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

41. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකි වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකටද යටත් විය යුතුය.

42. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල — අර්ථ නිරූපනය හා නිර්වචන

"සභාපතිවරයා " යන්නෙන් .......................... ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව " යන්නෙන්, .................................... ප්‍රාදේශීය සභාව ද අදහස් වන්නේය.

"ලේකම්වරයා" යන්නෙන්, ................................ තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"පවුල් කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් පස් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහක් සහිත කාමරයක් ද,

"තනි ඇඳ'' යන්නෙන් අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200ක් හා පළල සෙන්ටි මීටර් 95ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද ;

"තනි කාමරය'' යන්නෙන්, එක් තැනැත්තෙකුට පමණක් නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ තනි ඇඳක් සහිත කාමරයක් ද ;

"ත්‍රිත්ව කාමරය'' යන්නෙන් එකවර තැනැත්තන් තුන් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හා තනි ඇඳක් හෝ තනි ඇඳන් තුනක් සහිත කාමරයක් ද ;

"යුගල ඇඳ'' යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200ක් හා පළල සෙන්ටි මීටර් 125ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද ;

"යුගල කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් දෙදෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකක් සහිත කාමරයක් ද,

"නවාතැන්පොළක්'' යන්නෙන්, ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙළ කළ ආහාර වර්ගයක් හෝ එකී කාර්යයන් සමග ගණුදෙනුකරුවන් නවාතැන් ගැනීම ඉඩකඩ සලස්වා ඇති ස්ථානයක් අදහස්වේ.

"බලපත්‍රලාභියා " යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය " යන්නෙන්, මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ........................... ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන් එකී ස්ථානයේ නවාතැන් කටයුතු හෝ කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

## උපලේඛනය I

(4 වන අතුරු ව්‍යවස්ථාව)

***නවාතැන් පොළක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය***

01. ඉල්ලුම්කරුගේ නම : .........................
ලිපිනය : .........................
ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : .........................

02. නවාතැන්පොළෙහි නම : .........................

ලිපිනය :.........................

කළමනාකරුගේ/භාරකරුගේ නම :.........................

දුරකථන අංකය :.........................

03. බලපත්‍රය ඉල්ලා සිටින වර්ෂය : .........................

04. නවාතැන් පොළෙහි -

(i) තනි කාමර සංඛ්‍යාව :.........................

(ii) යුගල කාමර සංඛ්‍යාව :.........................

(iii) ත්‍රිත්ව කාමර සංඛ්‍යාව :.........................

(iv) පවුල් කාමර සංඛ්‍යාව :.........................

(v) එකවර නවාතැන් ගත හැකි සම්පූර්ණ සංඛ්‍යාව :.........................

05. නවාතැන් පොළෙහි නියුක්ත සේවක සංඛ්‍යාව (කළමනාකරු ද සමග) :.........................

05. වැසිකිළි -

(i) පිරිමි සේවක වැසිකිළි සංඛ්‍යාව :.........................
(ii) පිරිමි සේවක කැසිකිළි සංඛ්‍යාව :.........................
(iii) කාන්තා සේවක වැසිකිළි සංඛ්‍යාව :.........................
(iv) ගණුදෙනුකාර පිරිමි වැසිකිළි සංඛ්‍යාව :.........................
(v) ගණුදෙනුකාර පිරිමි කැසිකිළි සංඛ්‍යාව :.........................
(vi) ගණුදෙනුකාර කාන්තා වැසිකිළි සංඛ්‍යාව :.........................

06. නාන කාමර -

(i) පිරිමි නාන කාමර සංඛ්‍යාව :.........................
(ii) කාන්තා නාන කාමර සංඛ්‍යාව :.........................

07. මුළුතැන් ගෙවල් සංඛ්‍යාව :.........................

08. ජල සම්පාදන ප්‍රභවය :.........................

09. ඝන අපද්‍රව්‍ය, අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය :.........................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. නවාතැන් පොළ විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පිළිපැදීමට එකඟ වෙමි. එකී අතුරු ව්‍යවස්ථා යටතේ ඉහත නම් සඳහන් නවාතැන්පොළ පවත්වාගෙන යාම සඳහා 20 .............. වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

.................................
අයිතිකරු/කළමනාකරු/භාරකරුගේ අත්සන.

20.................................. දින.

............................................ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. ...................... ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ බේකරි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. ............................. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන බේකරි මහජන සෞඛ්‍ය සුරැකෙන පරිදි පවත්වාගෙන යාමට විධිමත් වැඩ පිළිවෙලක් නියාමනය කිරීම හා පාලනය කිරීම අරමුණ වේ. — අරමුණ

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමඟ කියවිය යුතු 126(ix)(ඌ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ බේකරියකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය :- — ඉටු කළ යුතු කාර්යයන්

(අ) බේකරියේ නිෂ්පාදනය කරන කෑම වර්ග සඳහා තාපය ලබා ගන්නා මාධ්‍ය කවරක් වුව ද මේ ඡේදයේ සඳහන් නියමයන් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(i) බේකරිය මනා අලුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතු ය.,
(ii) බේකරියේ සෑම කාමරයක ම පිටතට විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර විවෘත කළ විට ජනේල කවුළුවල වර්ගඵලය කාමරයේ භූමියේ වර්ගඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය,
(iii) සෑම කාමරයක ම සිවිලිමක් සවිකර තිබිය යුතු අතර සුදු පාටින් තීන්ත ආලේපකර තිබිය යුතු ය,
(iv) සෑම කාමරයක ම බිම සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය,
(v) බේකරියේ උඳුන ස්ථානගත කරනු ලබන කාමරය පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 3ක් උසට තිබිය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ බිත්තිය දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතු ය,
(vi) බේකරියේ උඳුන ස්ථානගත කළ කාමරය හැර සෙසු සෑම කාමරයක් ම පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 2.75ක් උසට තිබිය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් හෝ ඇළුමිනියම් සහ ලීයෙන් හෝ බැඳ දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතු ය,
(vii) බේකරිය තුළ ලීයෙන් කළ සියලුම සවිකිරීම් කොටස්වල තීන්ත ආලේපකර තිබිය යුතු ය,
(viii) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 1.8කට ඉහළින් තිබිය යුතුවාත් හැර අගු වාසිය අවම වශයෙන් මීටර් 1 විය යුතු ය,
(ix) නිෂ්පාදන කාර්යය සඳහා පානය කිරීමට සුදුසු තත්ත්වයේ ජලය පාවිච්චි කිරීමට විධිවිධාන සලසා තිබිය යුතු ය,
(x) නිෂ්පාදන කාර්යය සඳහා ජලය පාවිච්චි කරන සෑම කාමරයකට ම ආරක්ෂිත ජල සැපයුමක් නළ මගින් සපයා තිබිය යුතු අතර බැහැර කරන අපවිත්‍ර ජලය ගලායාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් සකස් කර තිබිය යුතු ය,
(xi) බැහැර කෙරෙන අප ජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය,
(xii) අතුරු ව්‍යවස්ථාවේ 9 හි නියම කර ඇති ආකාරයට අප ද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩපිළිවෙල ඇතිකර තිබිය යුතු ය.

(ආ) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය දර පාවිච්චි කරන බේකරියක් වන විට -

(i) බේකරියේ උඳුනේ දුම් කවුළුවේ ඉහළ කෙළවර අවම වශයෙන් පොළොව මට්ටමෙන් මීටර් 7.5 උසට බැඳ තිබිය යුතු ය.

(ii) පිටි අනන සියලු ම මේස මතුපිට පළුදු නොතිබෙන සේ සුමට කර තිබිය යුතු අතර ලී පිරිද්දුම් අතර හිඩැස් නොමැති වනසේ පුරුද්දා තිබිය යුතු ය. නැතහොත් මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් පිරිද්දුම්වලින් තොරව ආවරණය කර තිබිය යුතු ය;
(iii) බේකරි උඳුනෙන් ඉවත් කරන දැවී ගිය අළු සහ ශේෂ දැව කොටස් ඉවත් කිරීමට ප්‍රමාණවත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් සපයා තිබිය යුතු ය.
(iv) බේකරි උඳුනේ පිටත තීන්ත හෝ හුණු ගා තිබිය යුතු ය;
(v) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර බේකරියට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය;

*(ආ)* බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය විදුලි බලයෙන් ක්‍රියා කරන බේකරියක් වන විට -

(i) බේකරි උපකරණ වලට විදුලිය සම්බන්ධ කරන විදුලි ජේනු ආරක්ෂිත තත්ත්වයේ පැවතිය යුතු අතර අධි වෝල්ටීයතාව ඇතිවන අවස්ථාවක දී හෝ විදුලිය කාන්දු වීමක දී විදුලිය ස්වයංක්‍රීයව විසන්ධි කෙරෙන උපකරණ සවිකර තිබිය යුතු ය ;
(ii) බේකරි පරිශ්‍රය තුළ සවිකර ඇති විදුලි පරිපථවල විදුලි රැහැන් පිටතට විදුලිය කාන්දුවීම්වලින් තොර බට හෝ පෙට්ටි ඇතුළතින් ඇද තිබිය යුතු අතර පිටතට නිරාවරණය වූ විදුලි රැහැන් කෙළවරවල් නොතිබිය යුතු ය;
(iii) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සහ විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය;

5. තීන්ත ආලේප කර තිබිය යුතු යයි 4 වන අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති සෑම කොටසකම අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතු ය.

6. පිටි ඇනීම සඳහා යොදා ගන්නා සෑම කාමරයක ම ගෙබිම, යටත් පිරිසෙයින් සෑම දිනයක ම එක් වරක්වත් සේදීමට සැලැස්විය යුතු ය.

7. බේකරිය සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

(අ) බලපත්‍ර ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතුය.

8. බේකරියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් බේකරියේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවටත් බේකරියේ කාර්යයන් හි නියුක්ත වීමට පෙර හොඳින් ඇඟ සෝදා පිරිසිදු වී සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. *(අ)*බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -
(i) ජෛවහායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරායකර අප ද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

10. බේකරියේ පාවිච්චිය සඳහා තබාගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය ගබඩා කිරීමට ඒ සඳහා ම වෙන් වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිත වූ ද මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන් සහ මීයන්ට ඇතුල්විය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතු ය.

11. අතුරු ව්‍යවස්ථා 10 හි සඳහන් ගබඩා කාමරයේ පිටි ගබඩා කිරීමේ දී, අවම වශයෙන් පොළොව මට්ටමෙන් සෙන්ටි මීටර් 20ක් උස පාද මත තැනූ ලෑලි තට්ටුවක් යොදාගත යුතු අතර, එකී ලෑලි තට්ටුව හිස්ව තිබෙන විට පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි ආකාරයෙන් නිම කර තිබිය යුතු ය. එසේ ම එකී ලෑලි තට්ටුව යටින් මීයන්ට සහ කවර හෝ වර්ගයක කෘමින්ට රැඳී සිටිය නොහැකි වන සේ ආවරණය කර තිබිය යුතුවාත් හැර අවම වශයෙන් බිත්තියෙන් සෙන්ටි මීටර් 23ක් ඈතින් තබා තිබිය යුතු ය.

12. අතුරු ව්‍යවස්ථා 11 හි සඳහන් ලෑලි තට්ටු අවම වශයෙන් මාසයකට දෙවරක් බැගින් කාමරයෙන් පිටතට ගෙන පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. බේකරියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වනසේ වැසිකිළි සකස් කර තිබිය යුතුවාත් හැර කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙන ම වැසිකිළි තිබිය යුතු ය. එසේ ම එකී වැසිකිළි බේකරියේ කාමරවල සිට අවම වශයෙන් මීටර් 15ක් දුරින් ස්ථානගත කර තිබිය යුතු ය.

14. බේකරියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

15. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් සෑම ස්ථානයක ම හොඳින් පෙනෙන තැනක සම්මත පඩි සහිත තරාදියක් හෝ වෙනත් කිසියම් වර්ගයක සම්මත තරාදියක් තැබීමට සැලැස්වීම සහ කිසියම් ගනුදෙනුකරුවෙකු විසින් ඉල්ලා සිටි විට විකුණන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති යම් බේකරි නිෂ්පාදනයක බර කිරා බැලීමට හෝ බර කිරා පෙන්වීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. කිසියම් බේකරියක නිෂ්පාදනය කරන බේකරි නිෂ්පාදන බලපත්‍රලාභියා විසින් ම ප්‍රවාහනය කිරීම කරනු ලබන්නේ නම් දූවිලි හෝ වෙනත් අප ද්‍රව්‍ය හෝ ජලය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ පෙට්ටි යොදා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

17. සභාපතිවරයා විසින් උපලේඛන 1 හි අයදුම්පත්‍රය මගින් කරන ලද ඉල්ලීමක් මත තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ බේකරියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය. නොකළ යුතු කාර්යයන්

18. බේකරි නිෂ්පාදන සඳහා යොදා ගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය කල් ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත් කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය බේකරි නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

19. *(අ)* කිසියම් ආසාදන ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත විම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

20. බේකරි නිෂ්පාදන සඳහා මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ජලය යොදා ගැනීම නොකළ යුතු ය.

21. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර බේකරියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතු ය. එසේ වුව ද බේකරියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය.

22. බේකරියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18කට අඩු දුරකින් කසළ වලක් හෝ පොර වලක් හෝ අළු වලක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය.

23. කවර හෝ තැනැත්තෙකු විසින් බේකරිය ඇතුළත දුම්බීම හෝ බුලත් සැපීම හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් සැපීම හෝ ආහාර ගැනීම හෝ නොකළ යුතු ය.

අයකිරීම් හා ගාස්තු

24. කිසියම් බේකරියක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය.

බලය පැවරීම

25. මෙම අතුරු ව්‍යවස්ථාවලට අදාල කටයුතු නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලය එහි සභාපතිවරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

26. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිය ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

27. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

28. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බේකරියක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර, කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීම් සඳහා සහභාගිවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු වන්නේය.

30. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බේකරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

31. අතුරු ව්‍යවස්ථා 30හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

32. අතුරු ව්‍යවස්ථා 30හි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නිත්‍යානුකූල විය යුතු ය.

33. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව ප්‍රාදේශීය සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

34. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයෙන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

35. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපනය හා නිර්වචන

"සභාපතිවරයා" යන්නෙන්, .......................... ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, .......................... ප්‍රාදේශීය සභාව ද අදහස් වන්නේය.

"ලේකම්වරයා" යන්නෙන්, .......................... තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"බලයලත් නිලධාරි" යන්නෙන්, තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ........................ ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"බේකරි නිෂ්පාදන" යන්නෙන්, විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත කිසියම් බේකරියක නිපදවන පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ කිසියම් රස කැවිලි ද,

"බේකරිය" යන්නෙන් විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ රස කැවිලි සාදන යම් ස්ථානයක් අදහස් වන අතර එවැනි ආහාර පිළියෙල කරනු ලබන හෝ එවැනි ආහාර පිළියෙල කිරීම සඳහා ද්‍රව්‍ය ගබඩා කර තබන කිසියම් ස්ථානයක් ද,

"බලපත්‍ර ලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් කරන අතර, එකී බලපත්‍ර ලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින තැනැත්තෙකු ද,

"බලපත්‍ර ලත් ස්ථානය යන්නෙන්" මෙහි කවර අතුරු ව්‍යවස්ථාවල හෝ නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද අදහස්වේ.

*උපලේඛනය 1*

*............................ ප්‍රාදේශීය සභාව*

**වෙළඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20.......... වර්ෂය**

1. කර්මාන්තය/වෙළඳාම හිමිකරුගේ නම : ..........................................

2. පෞද්ගලික ලිපිනය : ..........................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

4. දුරකථන අංකය ඃ ජංගම : ..........................................  නිවාස : ..........................................

5. කර්මාන්තයේ/වෙළඳ ව්‍යාපාරයේ නම : ..........................................

6. කර්මාන්තයේ /වෙළඳාමේ ස්වභාවය : ..........................................

   කර්මාන්තය/වෙළඳාම කරන ස්ථානයේ : ..........................................

   *(අ)* ලිපිනය : ..........................................

   *(ආ)* වීථියේ/පාරේ නම : ..........................................

   *(ඇ)* වරිපනම් අංකය : ..........................................

   *(ඈ)* දුරකථන අංකය : ..........................................

7. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය : ..........................................

   කොට්ඨාසයේ නම : ..........................................

8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය : ..........................................

9. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළමණාකරුගේ/නියෝජිතයාගේ නම : ..........................................

10. ජාතික හැඳුනුම්පත් අංකය ඃ | | | | | | | | | | |

11. දුරකථන අංක ඃ ජංගම : ..........................................

    නිවස : ..........................................

සභාපති

....................................

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20........... වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය ඃ ................

....................................

ඉල්ලුම්කරුගේ අත්සන.

........................ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. ........................ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. ........................ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කෙරෙන සියලුම ප්‍රචාරක දැන්වීම් මහජනයාට හා පරිසරයට හිතකර අන්දමින් නීති රීතිවලට අනුකූලව විධිමත්ව නියාමනය කිරීම හා පාලනය කිරීම අරමුණවේ. — අරමුණ

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126 (xxx) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩ දෙනු ලබන ප්‍රදේශ කවරේද යන්න ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකිය. ප්‍රචාරක දැන්වීමේ ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ පිළිබඳව කලින් කල ප්‍රාදේශීය සභා විසින් ගනු ලබන තීරණය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය වන අතර එකී නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින හෝ එහි නිශ්චිතව දැක්වෙන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතුය. — ඉටු කළ යුතු කාර්යයන්

5. මෙම අතුරු ව්‍යස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව සඳහා පමණක් වලංගු විය යුතුය.

6. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තෙකු ම විසින්, අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට වැඩකරන දින 2කට පෙර මෙහි පළමු වන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කර ගත් අයදුම්පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

*(අ)* බලපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් ම සමග මිලිමීටර් 210 මිලිමීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1:1000 පරිමාණයට අනුව පිළියෙල කල දැන්වීමේ ආදර්ශයක් සහ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ හෝ ස්ථානවල මිලි මීටර් 210 මිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1 : 1000 පරිමාණයට අඳින ලද භූමි සැලැස්මක්/සැලසුම් ඉදිරිපත් කර තිබිය යුතු අතර ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතුය.

7. ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක ඒ බව සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබීමෙන් අනතුරුව ඔහු විසින් 22 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුව සහ 17(අ) වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ඇප මුදල ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබීමෙන් පසුව අදාළ බලපත්‍රය නිකුත් කිරීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතුය.

(අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණද කිසියම් ආගමික කාර්යයක් හෝ මුදල් අයකිරීමකින් තොරව පවත්වනු ලබන යම් සංස්කෘතික කාර්යයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් බලපත්‍ර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය. එසේ වුව ද එවැනි ප්‍රචාරක දැන්වීමක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන්ම අදාළ විය යුතු ය.

8. ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහා නිකුත් කළ බලපත්‍රයේ අංකය ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළවරේ සටහන් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දන්වීම ප්‍රදර්ශනය කරනු ලබන අවසාන දිනයෙන් පසුව පැය හතළිස් අටක් ගත වීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් හෝ ස්ථානවලින් ඉවත් කරවීමට සැලැස්වීම එකී බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

10. කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය සහ/හෝ ලිපිනය සමග වෙනත් කිසියම් වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක සහ කිසියම් නිවාසයක කවර හෝ ආකාරයේ වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, ඒ ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීම් මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත් විය යුතුය. මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් බලපත්‍ර ලබාගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමනාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතුය.

නොකළ යුතු කාර්යයන්

11. *(අ)* සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නිකුත් කරනලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

*(ආ)* ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු බලපත්‍රයක් ලබා ඇත්තේ වුව ද කවර හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදාළ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථානවල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

*(අ)* මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබූ කලාපයක් තුළට අයත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට වන ඉල්ලීමක් විය යුතු ය,

*(ආ)* දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තෙකුට කලින් නිකුත් කළ බලපත්‍රයක වලංගු කාල සීමාව අවසන් වී තිබිය යුතු ය. එසේ වුව ද කලින් නිකුත් කළ හා තවදුරටත් වලංගු බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම් ප්‍රදර්ශනය වීමට බාධාවක් නොවන පරිදි ඊට ආසන්නයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් නිකුත් කිරීමට මේ විධිවිධාන බාධාවක් නොවිය යුතු ය,

*(ඇ)* ප්‍රදර්ශන බලපත්‍රය ඉල්ලා සිටින දැන්වීම අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හානිකර හෝ කවර හෝ ආගමකට හෝ ජන වර්ගයකට හෝ ජන කොට්ඨාසයකට හානිවන හෝ එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන හෝ ආකාරයේ දර්ශන හෝ වදන් හෝ ඇතුළත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතු ය,

*(ඈ)* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරනු ලැබ ඇති දැකුම් පැළැල්ලක ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ඉල්ලා ඇති අවස්ථාවක එකී දැකුම් පැළැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තිබිය යුතුවාත් හැර ඒ අවස්ථාව වන විටත් කලින් නිකුත් කළ කිසියම් බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා වෙන්කළ කාලය ඉකුත් වී තිබිය යුතු ය.

*(ඉ)* කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොවිය යුතු ය.

13. ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට හෝ වාහනයකට හෝ අවහිර වීමක් හෝ අනතුරක් සිදුවන ආකාරයෙන් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතු ය. එසේම වාහන පදවාගෙන යනු ලබන කිසියම් රියැදුරෙකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් හෝ ඔහුගේ දර්ශනයට අවහිර වන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා සවිකිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකර ඇති බවට ගමනාගමන උපදේශක කමිටුවේ නිර්දේශයක් ලබාගෙන මිස ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

14. ප්‍රදර්ශනය සඳහා වලංගු බලපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතු ය.

15. කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් පොදු ස්ථානයක තිබෙන හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක හෝ වෙනත් කිසියම් කොටසකට හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවිකිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම කවරකු විසින් හෝ නොකළ යුතුය.

16. (අ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කවර හෝ ප්‍රදේශයක ප්‍රාදේශීය සභාව සතු කිසියම් ඉඩමක හෝ ප්‍රාදේශීය සභාව විසින් ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව ලබාගන්නා වෙනත් කිසියම තැනැත්තෙකු සතු ඉඩමක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැළලි ඉදිකර පවත්වාගෙන යාමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතුය. පළාත් පාලන ආයතනයේ කාර්යභාරය

(ආ) ඡේදය යටතේ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරනු ලැබ ඇති කිසියම් දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රදර්ශකයන්ගෙන් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතුය.

(ඇ) (ආ) ඡේදයේ විධිවිධාන යටතේ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තු පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ නිවේදනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

17. *(අ)* ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලබන තෙක් සභාපතිවරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

*(ආ)* කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණය පිළිබඳව ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන තීරණය *ගැසට් පත්‍රයේ* නිවේදනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

18. (අ) අතුරු ව්‍යවස්ථා 9 හි සඳහන් ආකාරයෙන් ක්‍රියා කිරීමෙන් අනතුරුව සභාපතිවරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත අදළ බලපත්‍රය නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලබන තෙක් සභාපතිවරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

*(ආ)* (අ) ඡේදයේ සඳහන් ආකාරයට ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව එකී තැන්පත් මුදල බලපත්‍රලාභියා වෙත නිදහස් කිරීමට පෙර -

(i) අතුරු ව්‍යවස්ථා 9 හි සඳහන් නියමයන් බලපත්‍රලාභියා විසින් නිසි ආකාරයෙන් ඉටු කර තිබේද යන බව

(ii) දැන්වීම ප්‍රදර්ශනය කරනු ලැබ ඇත්තේ ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරන ලද දැකුම් පැළැල්ලක වන අවස්ථාවක, ඒ දැන්වීම ඉවත් කිරීමේ දී හෝ බලපත්‍රලාභියා විසින් වගකිව යුතු කිසියම් කාර්යයක් හේතුවෙන් හෝ එකී දැකුම් පැළැල්ලට කිසියම් හානියක් වී නොමැති බව තහවුරු කර ගැනීම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

*(ඇ)* බලපත්‍රලාභියා විසින් 9 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියාකර ඇති බව සහ ප්‍රාදේශීය සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී නොමැති බව, (ආ) ඡේදයේ සඳහන් ආකාරයට තහවුරු කර ගැනීමේදී සභාපතිවරයා සෑහීමට පත්වන්නේ නම් මිස එකී තැන්පත් මුදල බලපත්‍රලාභියා වෙත සම්පූර්ණයෙන් නිදහස් කිරීම නොකළ යුතු ය. කිසියම් බලපත්‍රලාභියෙකු විසින් 9 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ ප්‍රාදේශීය සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී ඇති විට, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්යය කිරීම හෝ දැකුම් පැළැල්ල අලුත්වැඩියා කිරීම හෝ ඒ කාර්යයන් දෙකම සඳහා ප්‍රාදේශීය සභාවට දරන්නට සිදුවන වියදම් තැන්පත් මුදලෙන් අඩු කරගත යුතු අතර ඉතිරිවන යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල පමණක් බලපත්‍රලාභියාට ආපසු ගෙවිය හැකිය.

(ඇ) (ඇ) ඡේදයේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේදී ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතු මුදල තැන්පත් කරනු ලැබූ ඇප මුදලට වඩා වැඩිවන අවස්ථාවක, එසේ වැඩිදුරටත් අයවිය යුතු මුදල බලපත්‍රලාභියා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

අභිමතය/අත්හැරීම්/ නිදහස් කිරීම්

19. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය හෝ පෙන්නුම් කෙරෙන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, ගෘහ නාම පුවරු සහ කිසියම් දේපළක් බදු දීමට හෝ විකිණීමට හෝ කුලියට දීමට හෝ එකී දේපළ මත ප්‍රදර්ශනය කරනු ලබන "බදු දීමට" තිබේ හෝ "විකිණීමට තිබේ" හෝ "කුලියට දීමට" තිබේ යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එසේ වුව ද ඒ ආකාරයේ දැන්වීම් පුවරු එකකට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන යම් අවස්ථාවක එසේ වැඩිවන සෑම දැන්වීම් පුවරුවක් ම සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන බල පැවැත්විය යුතු ය.

20. රජය හෝ පළාත් සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

21. ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය -

(i) ප්‍රාදේශීය සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිකළ දැකුම් පැළැල්ලක් වන විට ඒ දැකුම් පැළැල්ලේ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 16(ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ප්‍රාදේශීය සභාවට ගෙවා තිබිය යුතුය; නැතහොත්

(ii) ඉල්ලුම්කරු නොවන වෙනත් යම් තැනැත්තෙකුට හෝ යම් අධිකාරයකට අයත් ස්ථානයක් වන විට ඒ තැනැත්තා හෝ ඒ අධිකාරය විසින් එකී ප්‍රචාරක දැන්වීම ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර තිබිය යුතුය.

බලය පැවරීම

22. මෙම අතුරු ව්‍යවස්ථාවලට අදාල කටයුතු නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලය එහි සභාපතිවරයා හෝ ලේකම් විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරී නිත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

23. (අ) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ කිසියම් බලපත්‍රයක් කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස එකී බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයකද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් හෝ දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර දී ඇති කාලය නිමවීමෙන් පසු අවසන් කළ යුතු ය.

(ආ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයේ කාලය අවසන් වීමෙන් අනතුරුව කිසියම් අනුගාමී වර්ෂය තුළදී ද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවක ඒ අනුගාමී වර්ෂය සඳහා එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව බලපත්‍රයක් ලබාගත යුතු ය. එසේ වුව ද ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට නිකුත් කරනු ලබන බලපත්‍රයක් වෙනුවෙන් අනුගාමී වර්ෂය තුළ අයකිරීමට ප්‍රාදේශීය සභාව සම්මත කර ඇති බලපත්‍ර ගාස්තුව කුමක් වුව ද එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලබන නව බලපත්‍රය වෙනුවෙන් කලින් සම්මත කළ බලපත්‍ර ගාස්තුව අදාළ විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

24. (අ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදගනු ලබන කවර අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදිකිරීමක් හෝ සවි කිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගෙන් දේපලකට අන්තරාදයක වන හෝ හානිවන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත්කරන ලෙස බලපත්‍රලාභියාට යොමු කරන දැන්වීමක් මගින් නියම කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ සඳහන් කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවකදී සභාපතිවරයා

හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කළ අවසර පත්‍රය අවලංගු කිරීම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කිරීම නිත්‍යානුකූල විය යුතු ය.

(ඈ) ඉහත (ආ) ඡේදයේ විධිවිධාන යටතේ කිසියම් අවසර පත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල ප්‍රාදේශීය සභාව සතු විය යුතුවාත් හැර ඒ ඇප මුදල ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

25. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදිකිරීම සඳහා පාවිච්චි කරන කවර හෝ ඉදිකිරීමක ආධාරකයක්, සවිකිරීමක් හෝ ඒ සඳහා පාවිච්චි කරන වෙනත් යම් කිසිවක් නිසා හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍ය වන අන්‍යාර්ථයක් හේතුවෙන් කිසියම් පාර්ශවයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් අවසර පත්‍රලාභියා වගකීමට යටත් විය යුතු ය.

26. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් මගින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් ඇතුළත් වූ ලෙස නොසැලකිය යුතු අතර එලෙස තේරුම් ගැනීම ද නොකළ යුතු ය.

27. යම් කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචිකව ප්‍රාදේශීය සභාවේ සභාපති, ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

28. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධාන එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයක් කඩ කර ඇති අවස්ථාවක ඒ කඩකිරීම පිළිබඳව අවධානය යොමු කරන නිවේදනයක් සමග නිකුත් කරනු ලැබූ කිසියම් අවසර පත්‍රයක් අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතුය.

දඩ හා දණ්ඩන

30. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපනය හා නිර්වචන

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"සභාපතිවරයා" යන්නෙන්, .............................. ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, ................... ප්‍රාදේශීය සභාවද අදහස් වන්නේය.

"ලේකම්වරයා" යන්නෙන්, ................................. තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"බලයලත් නිලධාරියා යන්නෙන්" .............................. තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"රථවාහන පොලිස් ස්ථානාධිපති යන්නෙන්" තත්කාර්යය සඳහා මූලස්ථාන පොලිස් ස්ථානාධිපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ .......................... පොලිස් ස්ථානයේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"කටවුට්" යන්නෙන්, ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කළ කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද ප්‍රචාරක දැන්වීමක්ද,

"දැකුම් පැළැල්ල" යන්නෙන්, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද,

"ප්‍රචාරක දැන්වීම" යන්නෙන්, කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරන කාර්යය සඳහා යොදා ගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළඳ දැන්වීමක් ද,

අදහස් වේ.

උපලේඛනය

***පළමුවන උපලේඛනය***

............................. *ප්‍රාදේශීය සභාව*

**දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය**

.................................. සභාපතිතුමා වෙතටයි.

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : ............................................
2. ජාතික හැඳුනුම්පත් අංකය : ............................................
3. දුරකථන අංකය :
4. ඉල්ලුම්කරු නොපැමිණෙන්නේ නම්
   නියෝජිතයාගේ නම සහ ලිපිනය : ............................................
   ජාතික හැඳුනුම්පත් අංකය : ............................................
   දුරකථන අංකය : ............................................
5. දැන්වීම් සම්බන්ධ විස්තර
   ප්‍රදර්ශනය කරන දිග x පළල වර්ග අඩි ප්‍රදර්ශනය වන දැන්වීම් වර්ග ප්‍රමාණය

| *ස්ථානය* | *අඩි ප්‍රමාණය* | *පැති ගණන* | *ගණන (මු.)* |
|---|---|---|---|
| i. ...................... | ...................... | ...................... | ...................... |
| ii. ...................... | ...................... | ...................... | ...................... |
| iii. ...................... | ...................... | ...................... | ...................... |

6. ප්‍රදර්ශනය කරන්නට යෙදෙන දැන්වීමේ විස්තරය : ............................................
   (දැන්වීමේ පිටපතක් අමුණා එවිය යුතුය.)
7. දැන්වීම ප්‍රදර්ශනය කරන කාලය ....................... සිට ................. දක්වා

...................... ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථාවන්ට එකඟව දැන්වීම ප්‍රදර්ශනය කිරීමටත්, නියමිත දිනට දැන්වීම ඉවත් කර ගැනීමටත් මේ හා සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන නිගමනයන් හා උපදේශනයෙන් පිළිපැදීමටත්, මම මෙයින් පොරොන්දුවෙමි. එම කොන්දේසි කඩ කල හොත් ඇප මුදල් ප්‍රාදේශීය සභාව සතු වන බවත් දනිමි.

තවද මෙහි සඳහන් විස්තර නිවැරදි බවටත්, සත්‍ය බවටත් සහතික කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත්, මා විසින් ඉදිරිපත් කර ඇති සියළුම බැනර් ප්‍රාදේශීය සභාව සතු කිරීමටත්, ප්‍රදර්ශනය කිරීමෙන් පසු හෙළි වුවහොත්, ඒ සියල්ල කපා ඉවත් කර, සභාව සතු කිරීමටත් යටත් වන බවට එකඟවෙමි.

දිනය : ................

.....................................
අයදුම්කරුගේ අත්සන.

### .......................... ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ
### වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා ...................... ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ මාර්ගවල රථ වාහන නතර කිරීම හා එකී මාර්ගවල රථ වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම මගින් මඟී ආරක්ෂාව හා රථවාහන අනතුරු වලක්වා ගැනීම උදෙසා. අරමුණ

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126 (vii) (ඌ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. *(අ)* ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිසියම් වීථියක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක - ඉටු කළ යුතු කාර්යයන්

(i) රථවාහන නවතා තැබීම තහනම් කිරීම;
(ii) සීමා කිරීම;
(iii) එක් පැත්තක පමණක් වාහන නවතා තැබීමට ඉඩ දීම;
(iv) බඩු බෑම හෝ පැටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම;
(v) මගීන් බැස්සවීම හෝ නැග්ගවීම තහනම් කිරීම;
(vi) බස් නැවතුම් ස්ථාන නම් කිරීම;
(vii) තනි අතට පමණක් වාහන ධාවනය කරන වීථි හෝ මාර්ග නම් කර ගමන් කළ හැකි දිශාව තීරණය කිරීම.

සඳහා ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

*(ආ)* ප්‍රාදේශීය සභාව විසින් *(අ)* ඡේදය යටතේ වන කිසියම් සීමා කිරීමක් කරනු ලැබීමෙන් අනතුරුව එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා අදාළ ස්ථානයේ සවිකිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය. එකී සීමා කිරීම් පිළිබඳ මාර්ග සංඥා, මෝටර් වාහන පනතේ 164 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වන දිනැති අංක 444/18 දරන 1 වන කොටස (1) වන ඡේදය *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති නියෝගවලට අනුව විය යුතුවාත් හැර එකී නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතු ය.

5. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය හරහා වැටී ඇති කිසියම් වීථියක හෝ මාර්ගයක ධාවනය කරන ඕනෑම වාහනයක රියැදුරෙකු විසින් 4 වන අතුරු ව්‍යවස්ථාවේ *(ආ)* ඡේදයේ නියමයන් යටතේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥාවකින් හෝ සංඥාවලින් නිරූපණය කෙරෙන නියමයන් පිළිපැදීම කරනු ලැබිය යුතු ය.

6. සෑම රථ ගාලක ම නවතා තැබීමට පැමිණෙන වාහන ඇතුල් කිරීමේ දොරටුව හා පිටවීමේ දොරටුව පහසුවෙන් කියවීමට හැකිවන ආකාරයෙන් භාෂාත්‍රයෙන් දැන්වීමක් සවිකර තිබිය යුතු අතර එකී ස්ථානය ඇතුළත වාහන නවතා තැබීමට පැමිණීමේ දී සහ ඉන් පිටතට ගැනීමේ දී ධාවනය කළ යුතු දිශාව පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයෙන් සෙන්ටි මීටර් 20ක පළලින් යුතු සුදු පාට රේඛාවක් සහිත ඊතල සලකුණු කර තිබිය යුතු ය.

7. සෑම රථ ගාලකම බිම තාර දමා හෝ කොන්ක්‍රීට් දමා තිබිය යුතු අතර එකී රථ ගාල පරිහරණය කරන්නන්ගේ පාවිච්චිය සඳහා ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයට වෙන් වෙන් වූ වැසිකිළි තනා තිබිය යුතුය. එසේම ස්ථානය තුළ රැස්වන ජලය පහසුවෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතු ය.

8. සෑම රථ ගාලකම පරිශ්‍රය තුළ එකතුවන කසළ දිනපතා බැහැර කිරීමට සහ එකී ස්ථානයේ පවත්නා වැසිකිළි දිනපතා විෂබීජ නාශක යොදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

9. සෑම රථගාලක ම වාහන නවතා තැබීමට ඉඩකඩ වෙන් කිරීමේ දී රථ ගාල ඇතුළට පැමිණෙන සහ ඉන් පිටවන වාහනවලට ගමන් කිරීම සඳහා ප්‍රමාණවත් ධාවන මං තීරු ඇතිකර තිබිය යුතු ය.

10. කිසියම් වාහනයක් රථ ගාල ඇතුළත ධාවනය කිරීමේ දී හා ගාල් කිරීමේ දී , ඒ තුළ ගාල් කර ඇති වෙනත් යම් වාහනයකට බාධාවක් නොවන පරිදි එක් එක් වාහනය නවතා තැබීමට රථ ගාල ඇතුළත ප්‍රමාණවත් ඉඩ කඩ වෙන් කර තිබිය යුතු අතර එක් එක් වාහනය සඳහා වෙන් කර ඇති සීමාව පෙන්නුම් කෙරෙන සෙන්ටි මීටර් 10ක පළලින් යුතු සුදුපාට රේඛාවකින් සලකුණු කර තිබිය යුතු ය.

11. කිසියම් රථ ගාලක නවතා තබන යම් වර්ගයක වාහනයක් නවතා තැබීම වෙනුවෙන් අයකිරීමට ප්‍රාදේශීය සභාව තීරණය කළ ගාස්තු ප්‍රමාණය එකී රථ ගාලේ ඇතුළ්වීමේ දොරටුවේ ප්‍රකටව පෙනෙන පරිදි භාෂාත්‍රයෙන් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

12. *(අ)* කිසියම් රථ ගාලක නවතා තබන වාහන වලින් ගාස්තු අයකිරීම සඳහා මෙහි මින් මතු “රථ ගාල භාරකරු” යනුවෙන් හඳුන්වනු ලබන —

(i) ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත කවර හෝ සේවකයෙකු ; හෝ
(ii) ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලැබූ කිසියම් සාර්ථක ටෙන්ඩර්කරුවෙකු හෝ එකී ටෙන්ඩර්කරු විසින් නම් කරනු ලැබූ ඔහුගේ අනුයෝජිතයෙකු ;

යෙදවීම කළ හැකි ය.

*(ආ)* එසේ වුව ද, කිසියම් රථ ගාලක වාහන නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය නොඉක්මවිය යුතුවාක් හැර එක් එක් වාහනය නවතා තැබීම වෙනුවෙන් අයකළ ගාස්තු ප්‍රමාණය මේ කොටසේ පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් කුවිතාන්සියක සටහන් කර වාහනයේ රියදුරා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

13. සෑම රථ ගාල භාරකරුවෙකු ම ඒ කාර්යයේ නියුක්ත වන කාලය ඇතුළත ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන හා රථ ගාල භාරකරු පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ ඇඳුමකින් සැරසී සිටීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

14. *(අ)* අතුරු ව්‍යවස්ථා 12 හි (ආ) ඡේදය යටතේ නවතා තැබීමට ඉඩදෙනු ලැබීමට තීරණය කර ඇති කිසියම් වර්ගයක රථයක් නවතා තැබීමට රථ ගාලට ඇතුල් කරන අවස්ථාවේ දී එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුව ළඟ දී එකී වාහනයේ රියැදුරා වෙත මේ කොටසේ දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසරය දක්වෙන ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නිකුත් කිරීම රථ ගාල භාරකරුගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඇතුල්වීමේ අවසර පත්‍රයක් සහිත සෑම වාහනයක් ම රථ ගාලෙන් පිටත්ව යාමට පෙර -

(i) *(අ)* ඡේදයේ සඳහන් කාඩ් පත්‍රය රථ ගාල භාරකරුට ආපසු භාරදීම;

(ii) අතුරු ව්‍යවස්ථා 11 හි සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබූ ප්‍රමාණයන්ට ගැලපෙන වාහන නවතා තැබීමේ ගාස්තුව රථ ගාල භාරකරුට ගෙවීම ; සහ

(iii) ගෙවන ලද ගාස්තුවට ගැලපෙන 12 වැනි අතුරු ව්‍යවස්ථාවේ *(ආ)* ඡේදයේ සඳහන් කුවිතාන්සියක් ලබා ගැනීම ;

එකී වාහනයේ රියැදුරාගේ කාර්යය විය යුතු ය.

15. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තිබෙන යම් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් වාහනය සඳහා නිකුත් කළ ඇතුල්වීමේ අවසර කාඩ් පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවක එය පරීක්ෂා කිරීම සඳහා ලබා දීම එකී වාහනයේ අයිතිකරුගේ හෝ රියදුරුගේ කාර්යය විය යුතු ය.

16. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටුවා තිබෙන යම් රථ ගාලක් ඇතුළත නවතා තබන -

*(අ)* රජයේ වාහනවලට,
*(ආ)* පළාත් සභාවේ වාහනවලට,
*(ඇ)* පළාත තුළ සංස්ථාපනය කර ඇති කිසියම් පළාත් පාලන ආයතනයක වාහනවලට,

මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද කිසියම් රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් වාහනයකට එකී විධිවිධාන මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයෙන්ම අදාළ විය යුතුය.

17. කිසියම් රථ ගාලක ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නොමැතිව නවතා තබා ඇති කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවත් කිරීමට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ ක්‍රියා කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

18. *අතුරු ව්‍යවස්ථා* 5 හි කුමක් සඳහන්ව තිබුණද 4 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ සවිකරනු ලැබූ කිසියම් මාර්ග සංඥාවක් මගින් නියම කරනු ලැබ ඇති සීමාවන් - නොකළ යුතු කාර්යයන්

*(අ)* එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ආසන්නයේ ඇති කිසියම් ගොඩනැගිල්ලක හෝ ඒ ආසන්නයේ ඇතිවන යම් ගින්නක් හෝ වෙනත් යම් ආපදාවක් මැඩ පැවැත්වීමේ කාර්යය සඳහා යොදා ගන්නා ප්‍රාදේශීය සභාවේ ගිනි නිවන රථයක් හෝ වෙනත් කවර වූ හෝ වාහනයක් සඳහා ;

(ආ) එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ඇතිවන වාහන තදබදයක් මග හැරවීම සඳහා හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත ඇතිවන වෙනත් කිසියම් අනපේක්ෂිත තත්ත්වයක් පාලනය කිරීම සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් අවස්ථාවෝචිත පරිදි කරනු ලබන විධානයක් අනුව ක්‍රියා කිරීම සඳහා ;

එකී 5 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම නොකළ යුතු ය.

19. *(අ)* කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තැබීමට ඉඩ දීමට ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති වර්ගයක වාහනයක් වන්නේ නම් මිස වෙනත් කවර වූ වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන කවර වූ වාහනයක් රථ ගාලක නවතා තැබීම හෝ රථ ගාලකට ඇතුල් කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

*(ආ)* රථ ගාලක නවතා තිබෙන කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවතට ගැනීම සඳහා එකී වාහනය පන ගැන්වීමට නොහැකි වන අවස්ථාවක දී, එකී වාහනය ඇදගෙන යාම සඳහා රථ ගාල තුළට පැමිණෙන කිසියම් වෙනත් යම් වාහනයක් එකී රථ ගාලට ඇතුල්කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇත්තේ නම් එසේ පැමිණෙන වෙනත් වාහනයකට (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද එකී වාහනය ඇදගෙන යාමේ දී රථ ගාලේ නවතා තිබෙන වෙනත් වාහනවලට කවර හෝ බාධාවක් හෝ හානියක් වන ආකාරයෙන් ඇදගෙන යාම නොකළ යුතු ය.

20. කවර තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක ඇතුළත -

*(අ)* වාහන සේදීම හෝ එසේ කිරීමට සැලැස්වීම;
*(ආ)* යම් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා එකී වාහනය පන ගැන්වීමට අත්‍යවශ්‍ය අලුත්වැඩියාවක් හෝ රෝදයක් මාරු කිරීමේ කාර්යයක් හෝ නොවන වෙනත් කවර හෝ අලුත්වැඩියාවක් කිරීම;
*(ඇ)* (ආ) ඡේදයේ සඳහන් කිසියම් අලුත්වැඩියා කිරීමකදී අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී හැර අනවශ්‍ය වන්නාවූ හෝ බාධාකාරී වන්නාවූ හෝ කිසියම් ශබ්දයක් හෝ ශබ්ද ඇති කිරීම;
*(ඇ)* එකී රථගාල භාරකරුගේ අවසරයක් නොමැතිව වාහනය නවතා ඇති ස්ථානයක සිට එම රථ ගාලේම වෙනත් ස්ථානයකට ගෙන ගොස් නැවතීම;

(ඉ) එකී රථ ගාලේ ධාවන මං තීරු හෝ ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු අවහිර වන සේ වාහන නවතා තැබීම;

(ඊ) අනතුරක් වැළැක්වීම හෝ වාහනයේ හෝ එහි රැඳී සිටින්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ හෝ කාර්යය සඳහා හැර යම් වාහනයක සවිකර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ නාද කිරීම;

(උ) ගාල් කර ඇති හෝ එකී රථ ගාලට ඇතුල්වන හෝ ඉන් පිටවන කිසියම් වාහනයක නලාව හැඬවීම;

(ඌ) මත්පැන් පානය කිරීම හෝ බුලත් කෙළ ගැසීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ කළ කෝලාහල කිරීම හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීම ; හෝ

නොකළ යුතු ය.

21. කිසියම් රථ ගාලක නවතා තබන කවර හෝ වාහනයක ආරක්ෂාව පිළිබඳ වගකීම එකී වාහනය රථ ගාල තුළ නවතා තබන තැනැත්තා වෙත තිබිය යුතුවාත් හැර යම් වාහනයකට රථ ගාල ඇතුළත දී සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව හෝ සභාපතිවරයා හෝ රථ ගාල භාරකරු හෝ වගකීමට යටත් නොවිය යුතු ය.

22. අතුරු ව්‍යවස්ථා 6 හි සඳහන් ආකාරයෙන් කිසියම් රථ ගාලක් ඇතුළත පිහිටි ධාවන මං තීරුවක වාහන ධාවනය කළ යුතු දිසාව පෙන්වන සලකුණු කර ඇති දිසාවට පටහැනි දිසාවට කවර හෝ අවස්ථාවක කිසියම් වාහනයක් ධාවනය කිරීම නොකළ යුතු ය.

23. කිසියම් රථ ගාලක කර ඇති යම් ඉදිකිරීමකට හෝ ඒ තුළ පවත්නා යම් උපකරණයකට හෝ හානි කිරීම හෝ විකෘති කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

24. රථගාලක් ඇතුළත වාහන නවතා තැබීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අයකළ හැකිය. අයකිරීම් හා ගාස්තු

25. (අ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ, මෙහි මින් මතු "රථ ගාල" යනුවෙන් හඳුන්වනු ලබන මෝටර් වාහන නවතා තැබීමේ කාර්යය සඳහා - අභිමතය/ අත්හැරීම්/නිදහස් කිරීම්

(i) ප්‍රාදේශීය සභාව සතු කිසියම් ඉඩමක් ; හෝ

(ii) වෙනත් කිසියම් අධිකාරයක් සමග ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව එකී අධිකාරය සතු කිසියම් ඉඩමක්; හෝ වෙන් කිරීමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

(ආ) කිසියම් රථ ගාලක නවතා තැබිය හැකි වාහන වර්ගය සහ එකවර නවතා තැබිය හැකි වාහන උපරිම වාහන සංඛ්‍යාව කොපමණද යන්න කලින් කල තීරණය කිරීම ප්‍රාදේශීය සභාව විසින් කරනු ලැබිය හැකි ය.

26. සෑම රථ ගාලකම අවම වශයෙන් වාහන ඇතුල්කිරීම සඳහා එක් දොරටුවක් සහ පිටවීම සඳහා එක් දොරටුවක් ද බැගින් දොරටු දෙකක් වෙන් කර තිබිය යුතු ය. එසේ වුව ද රථ ගාල ඇතුළත වාහන හැරවීම සඳහා ම වෙන් වූ කොටසක් ඇති කර තබන්නේ නම් හා එකවර වාහන දෙකක් දෙපසට ගමන් කළහැකි ද්විත්ව ධාවන මං තීරු හා දොරටුවේ ඉඩකඩ සලස්වා ඇති අවස්ථාවක වාහන ඇතුල්වීම සහ පිටවීම සඳහා එක් දොරටුවක් පමණක් තිබීමට සැලැස්විය හැකි ය.

27. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීම

28. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - (අර්ථ නිරූපනය හා නිර්වචන)

"සභාපතිවරයා" යන්නෙන්, ..................... ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන්, ....................... ප්‍රාදේශීය සභාව ද අදහස් වන්නේය.

"ලේකම්වරයා" යන්නෙන්, ............... තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"මාර්ගය" යන්නෙන්, ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩි පෙළක් ඒදණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටුමගකට, වීථියකට, දෙවැටකට, පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

"වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ කිසියම් මෝටර් වාහනයක් සඳහා දෙන ලද අර්ථ නිරූපණයට ගැලපෙන කිසියම් මෝටර් වාහනයක් අදහස් විය යුතු ය.

උපලේඛනය

*පළමුවන උපලේඛනය*

*12 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය*

*...................................................... ² සභාව*
*............................................ රථ ගාල*

*වාහන නවතා තැබීමේ ගාස්තු*

*ලදුපත් අංකය.................................................*

| | | |
|---|---|---|
| වාහනයේ අංකය | : | ............................................................................ |
| දිනය | : | 20 ......................................................................... |
| පැමිණි වේලාව | : | පෙ.ව./ප.ව. : .................................................. |
| පිටවූ වේලාව | : | පෙ.ව. /ප.ව : .............................................. |
| අයකළ ගාස්තුව | : | රුපියල් ........................................................... |

*දෙවැනි උපලේඛනය*

*14 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදය*

කාඩ් පත්‍රයේ ඉදිරිපස

**........................................................ ² සභාව**

**................................................................. රථ ගාල**

**ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රය**

කාඩ් පත්‍රයේ පිටුපස

**මෙම කාඩ් පත්‍රය අන්සතු නොකළ යුතු ය.**

**රථ ගාලෙන් පිටවන අවස්ථාවේ දී ආපසු භාරදිය යුතු ය.**

## ........................... ප්‍රාදේශීය සභාවේ
## සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මෙම අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙළඳාමෙහි යෙදෙන සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම මහජන සෞඛ්‍යයට අහිතකර නොවන අයුරින් සහ පාරිසරික ආරක්ෂාව සුරැකෙන අයුරින් විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම උදෙසා.

අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු 126 (x)(අ) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටු කළ යුතු කාර්යයන්

4. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ සංචාරක වෙළෙන්දෙකුට ආහාරපාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය.

(අ) විකිණීම සඳහා තබා ගනු ලබන ආහාර හෝ පාන වර්ග මැස්සන්ගෙන්, කෘමීන්ගෙන්, දූවිල්ලෙන් හෝ ජලයෙන් දූෂණය නොවන ආකාරයට සංවෘත භාජනයක් හෝ පෙට්ටියක් පාවිච්චියට ගැනීමට සූදානම් කර තිබිය යුතුය.

(ආ) ආහාර විකිණීමේදී ගනුදෙනුකරුවන්ට පිරිනැමීම සඳහා පාවිච්චි කිරීමට මල නොබැඳෙන ලෝහයෙන් තැනූ අල්ලුවක් තිබිය යුතු ය.

(ඇ) ගනුදෙනුකරුවන්ට ඒ අවස්ථාවේ දී ම පරිභෝජනය කිරීමට ආහාර හෝ පාන වර්ග පිරිනැමීම කරනු ලබන්නේ නම් ඒ සඳහාම වෙන් වූ වෙන් වෙන් භාජන තබාගෙන තිබිය යුතු ය.

(ඈ) ගනුදෙනුකරුවන් විසින් පරිභෝජනයෙන් පසුව ඉතිරි කරනු ලබන ආහාර කොටස් බහාලීම සඳහා වෙනම භාජනයක් ද ඉතිරි කරන පාන වර්ග ශේෂය බහාලීම සඳහා වෙනම භාජනයක් ද බැගින් තබාගෙන තිබිය යුතු අතර එකී භාජන හොඳින් වසා තැබිය හැකි පියනකින් යුක්ත විය යුතු ය.

5. සංචාරක වෙළඳාමේ යෙදෙන අවස්ථාවේදී ජනනය වන සියලුම අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය.
(ii) වීදුරු.
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය.
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය.
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් බැහැරලීම කළ යුතු ය.

6. සෑම බලපත්‍රලාභියෙකුම සංචාරක වෙළෙඳාමේ නියුක්ත වන සෑම අවස්ථාවකදී ම මෙම කොටසේ නියමයන් යටතේ ලබාගෙන ඇති බලපත්‍රය තමා සන්තකයේම තබාගත යුතු අතර සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු ඉල්ලා සිටි විටක පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කළ යුතු ය.

නොකල යුතු කාර්යයන්

7. අයදුම්පත්‍රයක් මගින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ඇති හෝටලයක, සාප්පුවක හෝ වෙළෙඳ පොළක නොවන වෙනත් කවර හෝ ස්ථානයක ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම නොකළ යුතුය.

8. සංචාරක වෙළෙඳාමේ යෙදෙන කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මංමාවතක හෝ මාර්ගයක ධාවනය කෙරෙන වාහනවලට හෝ ගමන් කරන පදිකයන්ට හෝ කිසියම් පොදු ස්ථානයක ගැවසෙන ජනතාවට බාධාවක් හෝ අනතුරක් සිදු නොවන ආකාරයෙන් තම වෙළෙඳාම කරගෙන යනු ලබන්නේ නම් මිස කරව හෝ පොදු ස්ථානයක සංචාරක වෙළෙඳාම නොකළ යුතු ය.

9. සභාපතිවරයා විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ කිසියම් කොටසක සංචාරක වෙළෙඳාම තහනම් කරනු ලැබ ඇති විටක, කවර හෝ තැනැත්තෙකු විසින් එකී කොටසේ සංචාරක වෙළෙඳාම නොකළ යුතු ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබා ඇත්තේ වුව ද කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජෞෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස සංචාරක වෙළෙඳාමේ යෙදීම නොකළ යුතු ය.

11. කිසියම් සංචාරක වෙළෙන්දෙකු විසින් වෙළෙඳාම් කරනු ලබන කවර හෝ ආහාර හෝ පාන වර්ගයක සාම්පලයක්, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

12. කිසියම් සංචාරක වෙළෙඳාමක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය. අයකිරීම් හා අරමුණ

13. (අ) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දිනෙන් අවසන් විය යුතු ය. බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

(ආ) (අ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුනද මහජනතාව රැස්වන කවර හෝ අකාරයක උත්සවයක් හෝ රැස්වීමක් හෝ පෙරහැරක් හෝ වෙනත් යම් ආකාරයක මහජන ඒකරාශිවීමක් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පවත්වනු ලබන කාලයකදී සංචාරක වෙළෙඳාම සඳහා සභාපතිවරයා විසින් තාවකාලික බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම නීත්‍යානුකූල වය යුතු ය. එසේ ම එකී බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ කිනම් දිනයක් සඳහා ද එ දිනෙන් පසුව ඒ බලපත්‍රය අවසන් විය යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට යම් සංචාරක වෙළෙන්දෙකු සංචාරක වෙළෙඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස්වේ. පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

15. (අ) ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් හෝ උදරාශ්‍රිත රෝග තත්ත්වයක් හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පැතිරෙන බවට හෝ එවැනි රෝග තත්ත්වයක් පැතිරීමේ අවදානමක් පවතින බවට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් සභාපතිවරයාට කරුණු වාර්තා කර ඇති යම් අවස්ථාවක

(i) ඒ පිළිබඳව ලිඛිතව කරුණු සඳහන් කරමින් මේ කොටසේ නියමයන් යටතේ නිකුත් කළ කිසියම් බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීමට,

(ii) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ කිසියම් කොටසක සංචාරක වෙළෙඳාම තහනම් කිරීමට;

(iii) (i) ඡේදය යටතේ තාවකාලිකව අත්හිටුවනු ලැබූ බලපත්‍රය, එසේ අත්හිටුවනු ලැබූ කාලය ඇතුළත සභාපතිවරයාගේ භාරයට ගනු ලැබීමට ;

(iv) බලපත්‍රය අත්හිටුවීමක් සිදු කරනු නොලැබුවේ නම්, එකී බලපත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට නියමිත දිනට පෙර එකී රෝග පැතිරීමේ අවදානම අවසන්වී ඇති බව

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් සභාපතිවරයාට කරුණු වාර්තා කරනු ලැබ ඇත්නම් අත්හිටුවනු ලැබූ බලපත්‍රය ප්‍රතිසාධනය කිරීමටත් ;

(ආ) (අ) ඡේදය යටතේ කිසියම් බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම නිසා බලපත්‍රලාභියාට සිදුවන යම් පාඩුවක් හෝ හානියක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව, සභාපතිවරයා, බලයලත් නිලධාරියා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වගකීමට යටත් නොවනු ඇත.

(ඇ) (අ) ඡේදයේ (11) අනුඡේදය යටතේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ කිසියම් කොටසක සංචාරක වෙළෙඳාම තහනම් කිරීමට හේතු වූ අවදනම අවසන් වී අති බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් සභාපතිවරයාට කරුණු වාර්තා කරනු ලැබ ඇත්නම් එකී කොටසේ සංචාරක වෙළඳාම සඳහා නැවත අවසර දෙනු ලබන බව බලපත්‍රලාභීන්ට දැන්වීම සභාපතිවරයා ගේ කාර්යය විය යුතුය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

16. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

17. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් සංචාරක වෙළෙඳාමක් 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පවත්වාගෙන යාම නොකෙරෙන අවස්ථාවක් වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක බලපත්‍රලාභියා වෙත ලිඛිතව කරනු ලබන දැන්වීමක් භාර දීමෙන් අනතුරුව බලපත්‍රලාභියාට සංචාරක වෙළෙඳාම සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

දඩ හා දණ්ඩන

18. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උප වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ අතුරු ව්‍යවස්ථාවල -

"සංචාරක වෙළඳාම" යන්නෙන් භාජනයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් ආකාරයක ආධාරකයක හෝ කිසියම් වාහනයක හෝ පා පැදියක හෝ කරත්තයක හෝ අත් කරත්තයක හෝ තබාගෙන මහජනතාවගේ පරිභෝජනය සඳහා විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එසේ ප්‍රදර්ශනය කරමින් විකිණීම හෝ කරනු ලබන ආහාර වර්ග හෝ පාන වර්ග වෙළෙඳාමක් අදහස් වන අතර ඒ ආකාරයෙන් තැනින් තැනට ගෙන යමින් හෝ කිසියම් තැනක නතර වී හෝ කරනු ලබන වෙළෙඳාමක් ද ඊට ඇතුළත් විය යුතු ය.

"සභාපතිවරයා" යන්නෙන් ...................... ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධුරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් .................... ප්‍රාදේශීය සභාව ද අදහස් වේ.

"ලේකම්වරයා" යන්නෙන් ................... තත්කාලයෙහි ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි " යන්නෙන් සභාවක යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු අදහස් වන අතර ඒ සභාවේ යම් සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙක් සහ ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඒ සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වශයෙන් ක්‍රියාකිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙක් ඊට ඇතුළත්වේ.

**.................. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථා .......................... සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ. (අතුරු ව්‍යවස්ථාවේ නාමය)

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව ................. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පවත්වාගෙන යාම අරමුණු කොට ගෙන මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට ඇත. (අරමුණ)

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය සමඟ කියවිය යුතු 126 (ix)ඒ උපවගන්තිය යටතේ ................... ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත. (අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන)

4. බලපත්‍රය ලබාගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළු වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය. (ඉටු කළ යුතු කාර්යයන්)

(අ) මාළු විකිණීම සඳහා මාළු ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

(ආ) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(ඇ) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය.

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අප ජලය උරා ගන්නා වළකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

(ඉ) මාළු වෙළඳ ස්ථානයෙන්, බැහැර කරන ලබන ජෛවහායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරෙන් වළ දැමීම හෝ ............................ සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව ...................... සභාවේ කසළ රැස් කිරීමේ වාහනයකට භාර දිය යුතුය.

(ඊ) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතුය.

(උ) බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන් හෝ කෘමීන් ගෙන් තොරව තබාගත යුතුය.

5. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මාළු කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

6. මැස්සන් හෝ කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කවර හො 'මාළු වර්ගයක් ප්‍රවාහනය නොකළ යුතුවාත් හැර එකී මාළු ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ මාළු ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජනය විෂබීජ නාශක යොද හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

8. මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතුය.

9. මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මාළු වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. (අ) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය :-

- (i) ජෛවභායන අපද්‍රව්‍ය.
- (ii) වීදුරු.
- (iii) කඩදසි හෝ කඩදසි ආශ්‍රිත ද්‍රව්‍ය.
- (iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය.
- (v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්.
- (vi) නිෂ්පාදනය සඳහා යොද ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්.
- (vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය .................... සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

නොකළ යුතු කාර්යයන්

12. සභාපති විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් .................... ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මාළු විකිණීම නොකළ යුතුය.

13. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස ශේෂවන කවර හෝ මාළු ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයෙහි මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

15. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිට කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම්

තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

16. අපජලය ගලා යාමට සලස්වන ලද උරාගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

17. (1) මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී මෙම ව්‍යවස්ථාවේ කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතුය. පළාත් පාලන ආයතනයේ කාර්ය භාරය

(2) බල ප්‍රදේශය තුළ මාළු කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් කලින් කල සාධාරණ වූත් නිත්‍යානුකූලවූත් යෝජනා හා සම්මුතින් හා කොන්දේසීන් ප්‍රකාශයට පත් කිරීම සභාවේ කාර්ය භාරය වන්නේය.

(3) බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ නම් එයට හේතු වූ කරුණු සභාපතිවරයා විසින් හැකිතාක් ඉක්මනින් ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුය.

18. බලපත්‍රලාභියා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම හේතුවෙන් යම් කාලයකට බලපත්‍ර අත්හිටුවීමේ අයිතිය හා එම අයට නැවත බලපත්‍රයක් ලබාදීම සලකා බැලීම හා දිගින් දිගටම බල පත්‍රයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කර හොත් එකී බලපත්‍රලාභියා වෙත නැවත බලපත්‍රයක් නිකුත් නොකිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතු වේ. අභිමතය/ අත්හැරීම්/නිදහස් කිරීම්

19. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයට පෙර එකී ස්ථානය ඒ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

20. ඉහත සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට (14) නොවැඩි විය යුතු ය.

21. ඉහත සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

22. කිසියම් මාළු කඩයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට සභාවට බලය ඇත්තේය. අයකිරීම් හා ගාස්තු

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු නියාමනය අධීක්ෂණය හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති එහි සභාපතිවරයා විසින් සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේය. බලය පැවරීම

24. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය. බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

25. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිශ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

26. නියමයක් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට ලේකම්වරයාට පරීක්ෂා කිරීම සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධාකිරීමක් නොකළ යුතුය.

27. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ ඇති කිසියම් මාළු කඩයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල හෝ වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූලව තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් ලේකම්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

28. (1) ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක විකිණීමට තබා ඇති යම් මාළු වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

(2) ඉහත සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය.

(3) එලෙස දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපති විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

29. යම්කිසි පැමිණිල්ලක් ලිඛිතව හෝ වාචික ප්‍රාදේශීය සභාවේ සභාපති ලේකම් හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබා දෙන්නේය.

අධීක්ෂණය

30. මෙම අතුරු ව්‍යවස්ථාව අධීක්ෂණය කිරීමේ බලය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියා සතුවේ.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

31. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපිත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතුය. එසේ වුවද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

දඩ හා දණ්ඩන

32. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 122(2) වන උපවගන්තියෙහි සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරිමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී උපවගන්තියෙහි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපනය හා නිර්වචන

කිසියම් ප්‍රාදේශීය සභාවක් විසින් මේ අතුරු ව්‍යවස්ථා යථා පරිදි පිළිගනු ලැබීමෙන් අනතුරුව, මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාව,

“සභාපතිවරයා” යන්නෙන් ......................... ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස්වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් .................. ප්‍රාදේශීය සභාව අදහස්වේ.

"ලේකම්" යන්නෙන් එය යම් .............. ප්‍රාදේශීය සභාවේ ලේකම් අදහස් වේ.

"මාළු කඩය" යන්නෙන් විකිණීම සඳහා මාළු ප්‍රදර්ශනය කරන ස්ථානයක් අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බල පත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍ර ලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන් මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත් කාර්යය සඳහා සභාපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන් එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස්වේ.

*උපලේඛනය*

**වෙළඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20........... වර්ෂය**

1. කර්මාන්තය/වෙළඳාම හිමි කරුගේ නම : ...........................................
2. පෞද්ගලික ලිපිනය : ...........................................
3. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |
4. දුරකථන අංකය : ජංගම : ........................................... නිවාස : ...........................................
5. කර්මාන්තයේ/වෙළඳ ව්‍යාපාරයේ නම : ...........................................
6. කර්මාන්තයේ /වෙළඳාමේ ස්වභාවය : ...........................................

   කර්මාන්තය/වෙළඳාම කරන ස්ථානයේ : ...........................................

   (අ) ලිපිනය : ...........................................
   (ආ) වීථියේ/පාරේ නම : ...........................................
   (ඇ) වරිපනම් අංකය : ...........................................
   (ඈ) දුරකථන අංකය : ...........................................
7. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානය අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය : ...........................................
   කොට්ඨාසයේ නම : ...........................................
8. ව්‍යාපාර නාම ලියාපදිංචිය ලබාගෙන ඇත්නම් එහි යොමු අංකය : ...........................................
9. කර්මාන්තය/වෙළඳාම කරගෙන යන ස්ථානයේ කළමණාකරුගේ/නියෝජිතයාගේ නම : ...........................................
10. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |
11. දුරකථන අංක : ජංගම : ...........................................
    නිවස : ...........................................

සභාපති
.....................................

ඉහත තොරතුරු සඳහන් කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථාන සඳහා 20........... වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය : ................

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. ........................ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන මස් වෙළඳාම වධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම අරමුණ වේ.

අතුරු ව්‍යස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමඟ කියවිය යුතු 126(ix)ඒ උපවගන්තිය යටතේ ................... ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

කළ යුතු කාර්යයන්

4. බලපත්‍රය ලබාගැනීමට ඉල්ලුම් කරන වෙළඳ ස්ථානය මෙහි පහත දක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස සභාපතිවරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මස් වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(අ) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

(ආ) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(ඇ) අපජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය.

(ඈ) ඉහත (ඇ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

(ඉ) අපජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

(ඊ) මස් වෙළඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවහායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 05ක් ගැඹුරෙන් වළ දැමීම හෝ ප්‍රාදේශීය සභාව විසින් කළින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව ප්‍රාදේශීය සභාවේ කසළ රැස් කිරීමේ වාහනයකට භාර දිය යුතු ය.

(උ) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

5. මැස්සන් හෝ කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කවර හො මසක් ප්‍රවාහනය නොකළ යුතුවාත් හැර එකී මාළු ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ මස් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජනය විෂබීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

6. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද මස් කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක සහ එහි අවට කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

8. බලපත්‍රලත් කවර හෝ මස් වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතුය.

9. බලපත්‍රලත් ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ පාවිච්චියට ගැනීම සඳහා බීමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් තබා ගැනීම කළ යුතු ය.

10. මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මස් වෙළඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. මසේ වෙළඳ සැලේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂනයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය. එසේ ම එක් එක් සේවකයා වෙනුවෙන් වෛද්‍ය වාර්තා අඩංගු ලේඛනයක් පවත්වා ගත යුතුය.

11. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. (අ) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය :-

(i) ජෛවහායන අපද්‍රව්‍ය.
(ii) වීදුරු.
(iii) කඩදසි හෝ කඩදසි ආශ්‍රිත ද්‍රව්‍ය.
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය.
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්.
(vi) නිෂ්පාදනය සඳහා යොද ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්.
(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස සභාපතිවරයා විසින් නියම කරනු ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයන්ට අනුකූල තත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් සභාපතිවරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතුය.

14. 13 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දන දහ හතරකට නොවැඩි විය යුතු ය.

15. කවර හෝ තැනැත්තෙකු විසින් වෙළඳ පොලක් නොවන වෙනත් කවර හෝ ස්ථානයක සභාපතිවරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මස් විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය. නොකළ යුතු කාර්යයන්

16. ගෝඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝඝාතකාගාරයකදී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස කවර හෝ මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

17. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස ශේෂවන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

18. කවර හෝ ගෝඝාතකාගාරයක් තුළ කිසියම් දිනකය දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝඝාතක ආඥාපනතේ 17 වන වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, කවර හෝමස් කඩයක වෙළෙඳම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළෙඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

19. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

20. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිට කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මස් වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) මස් වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය

21. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් වෙළෙඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිළදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතුය.

බලය පැවරීම

22. මෙම අතුරු ව්‍යවස්ථාවට අදළ කටයුතු නියාමනය කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරිම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලය එහි සභාපතිවරයා විසින් බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට ලිඛිතව පවරාදීම නිත්‍යානුකූල වන්නේය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

23. 13 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

24. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම කඩකිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

26. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන උපවගන්තියේ (2) වන උපවගන්තියේ දඩයකට යටත් විය යුතුය . එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරනු ලබන යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී 122 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකටද යටත් විය යුතුය. දඩ හා දණ්ඩන

27. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරිකෙුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මස් වෙළඳ ස්ථානයේ මස් වෙළෙඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක අදහස් වේ. අර්ථ නිරූපනය හා නිර්වචන

කිසියම් ප්‍රාදේශීය සභාවක් විසින් මේ අතුරු ව්‍යවස්ථා යථා පරිදි පිළිගනු ලැබීමෙන් අනතුරුව, මේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල

"සභාපතිවරයා" යන්නෙන් ........................ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස්වේ.

"ප්‍රාදේශීය සභාව" යන්නෙන් .................. ප්‍රාදේශීය සභාව අදහස්වේ.

"ලේකම්" යන්නෙන් එය යම් .............. ප්‍රාදේශීය සභාවේ ලේකම් අදහස් වේ.

"මස් කඩය" යන්නෙන් විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කරන ස්ථානයක් අදහස් වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍ර ලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන් මෙහි කවර අතුරු ව්‍යවස්ථාවක නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් තත් කාර්යය සඳහා සභාපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ..................... ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද අදහස්වේ.

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන් එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස්වේ.

04-642

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.